" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000



SLSI SYSTEM CERTIFIED ISO 9001
SLAB ACCREDITED
ISO/IEC: 17021
QMS-001-01


මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/FIN-AP/03/FI/02(A)
ඔබේ අංකය / உமது இலக்கம் / Your No. }
දිනය / திகதி / Date } 2022.10.31

**බස්නාහිර පළාත්**

**ව්‍යාපාර චක්‍රලේඛ අංක 09/2022**

බස්නාහිර පළාතේ,
සියළුම ලේකම්වරුන්,
පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන වල
සභාපතිවරුන් වෙත.

**රජය සතු ව්‍යවසායයන්හි සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස සංශෝධනය කිරීම.**

භාණ්ඩාගාර ලේකම්ගේ 2022.10.06 දිනැති "රජය සතු ව්‍යවසායයන්හි සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස සංශෝධනය කිරීම" සම්බන්ධයෙන් නිකුත් කරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 06/2022 හි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/06/02/19 හා 2022.10.21 දිනැති ලිපිය මඟින් ඉහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්:
i. ආණ්ඩුකාර ලේකම් (බ.ප.)
ii. විගණකාධිපති.
iii. සියළු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (බ.ප.)
iv. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) (බ.ප.)
v. තොරතුරු තාක්ෂණ නිලධාරී


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretarial, Colombo 01, Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: PE/COP/POLI/Circulars

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2022.10. 06

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 06/2022

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

රාජ්‍ය සංස්ථා (රාජ්‍ය බැංකු ද ඇතුළුව), ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්

<u>රජය සතු ව්‍යවසායයන්හි සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස සංශෝධනය කිරීම</u>

2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින් 2022.08.30 දින ඉදිරිපත් කරන ලද 2022 වර්ෂය සඳහා වූ අතුරු අයවැය කතාවෙහි අංක 11.2 යෝජනාව මත පදනම්ව හා 2022.10.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රජය සතු ව්‍යවසායයන්හි සේවයේ නියුතු සේවකයින්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස හා ඒ සම්බන්ධයෙන් වූ කොන්දේසි පහත පරිදි සංශෝධනය කෙරේ.

I. මෙම චක්‍රලේඛයේ III වන ඡේදයේ කොන්දේසිවලට යටත්ව, 2023.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි රජය සතු ව්‍යවසායයන්හි සේවකයින්ගේ වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55ක් වන අතර කිසියම් නිලධාරියෙකු වයස අවුරුදු 55 ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම්, සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා සේවයේ යෙදිය හැකිය.

II. අවුරුදු 55 සිට 60 අතර කාල පරිච්ඡේදය තුළ නිලධාරියාගේ අභිමතය පරිදි පත්වීම් බලධරයා වෙත මාස 3 ක පූර්ව දැනුම්දීමක් කිරීමෙන් අනතුරුව විශ්‍රාම ගත හැකිය.

III. කාර්යක්ෂමතාවය හා කාර්යසාධනය සතුටුදායක නොවන නිලධාරියකුට වයස අවුරුදු 55 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීමක් ලබා නොදීමට පත්වීම් බලධරයා තීරණය කරන්නේ නම්, එයට එරෙහිව නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සැලසෙන ආකාරයෙන් මාස 6ක පූර්ව දැනුම්දීමකින් පසුව එම සේවකයා විශ්‍රාම ගැන්වීමේ බලය පත්වීම් බලධරයා සතුවේ.

IV. වයස අවුරුදු 60 ඉක්මවා දැනට සේවයේ යෙදී සිටින සහ 2022.12.31 දින හෝ එදිනට පෙර වයස අවුරුදු 60 සම්පූර්ණ වන රජය සතු ව්‍යවසායයන්හි සේවකයන් 2022.12.31 දිනට හෝ ඊට ප්‍රථම අනිවාර්යයෙන්ම විශ්‍රාම ගත යුතුය.

2021.12.14 දිනැති හා අංක 02/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මෙයින් අවලංගු වේ.

මෙ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් අවශ්‍ය නම්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ( දු.අ. 011-2484617) හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( දු.අ. 011-2484627) අමතා ලබා ගත හැකිය.

කේ.එම්. මහින්ද සිරිවර්ධන

භාණ්ඩාගාර ලේකම්

පිටපත්: 1. ජනාධිපති ලේකම්

2. අග්‍රාමාත්‍ය ලේකම්

3. අමාත්‍ය මණ්ඩල ලේකම්

4. විගණකාධිපති

5. ලේකම්, ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාව